# පරිසර සම්පත් පැතිකඩ

**601 - වෙනිවැල්කොල**

1. හැඳින්වීම
   I. මූලික තොරතුරු
      a) වසම හා අංකය - වෙනිවැල්කොළ 601
      b) වපසරිය (හා අක්කර හා හෙක්ටයාරවලින්) - වර්ග කිලෝමීටර් 08 / හෙක්ටයාර් - 800/ අක්කර 1976.84
      c) ප්‍රා.ලේ. කොට්ඨාසය - හෝමාගම
      d) ගොවිජන හා කෘෂපනිස කොට්ඨාසය - 1/4 කහතුඩුව, 1/4/20 වෙනිවැල්කොළ
      e) සෞ වෛ නි කොට්ඨාසය - කහතුඩුව
      f) පශු වෛ නි කොට්ඨාසය - හෝමාගම
      g) බීට්ටු වන කාර්යාල කොට්ඨාසය - කළුතර
      h) අඩවි වන කාර්යාල කොට්ඨාසය - වග
      i) වාරිමාර්ග ඉංජිනේරු කොට්ඨාසය - කොළඹ
   II. ජනගහණය - 6149 (ස්ත්‍රී - 3132 / පුරුෂ - 3017)
   III. ජනවාසකරණයේ ස්වභාවය - ග්‍රාමීය 6149
   IV. දේශගුණික තොරතුරු
      a) අක්ෂාංශ හා දේශාංශගත පිහිටීම - 80.00318 හා 6.84327
      b) උෂ්ණත්වය (සාමාන්‍ය/උපරිම/අවම) - 30.68C
      c) වර්ෂාපතනය - 390mm   උපරිම - 32C
      d) සාපේක්ෂ ආර්ද්‍රතාව - 33  අවම - 29.8C
   V. පාංශු තොරතුරු
      a) පසේ ස්වභාවය - තෙත් සහිත ලෝම මැටිපස
      b) පසේ වර්ගය - රතු සහ පොඩ්සොලික්
      c) සුලබ පාෂාණ ස්ථිත්වය (ග්‍රැනයිට්/ග්‍රැෆයිට්/ෆෙල්ස්පාර් ආදිය) - ග්‍රැනයිට්

2. පරිසර සම්පත් පැතිකඩක් පිළියෙළ කිරීමේ අවශ්‍යතාව
   I. සම්පත් පිළිබඳ සමාලෝචනය කිරීම.
   II. තිරසර සම්පත් භාවිතාව හා කළමනාකරණය කිරීම.
   III. පාරිසරික ගැටළු හඳුනාගැනීම හා ඒවාට විසඳුම් යෝජනා කිරීම.
   IV. පරිසර කළමනාකරණයෙහිලා ප්‍රජාවේ දායකත්වය, සහභාගීත්වය හා අවබෝධය පුළුල් කිරීම.
   V. සංවර්ධන යෝජනා හඳුනාගැනීම හා පරිසර ශක්‍යතා සමගාමී කිරීම
   VI. ආපදා අවදානම් හඳුනාගැනීම හා බලපෑම් අවම කර ගැනීම.
   VII. අඛණ්ඩ මෙහෙයුම්කරණය, අධීක්ෂණය හා අගැයීම ස්ථාපිත කිරීම.

3. ස්වාභාවික සම්පත් පැතිකඩ

I. භෞමික සම්පත්

a) වපසරිය/භූමි ප්‍රමාණය (km2 හා අක්කර හා හෙක්ටයාරවලින්)

වර්ග කිලෝමීටර් - 08 / හෙක්ටයාර් - 800 / අක්කර - 1977

b) භූමි පරිහරණ සැලසුම

- කෘෂිකාර්මික කටයුතු සඳහා භූමි පරිහරණය
  i. වී - අක්කර 190 (A ශ්‍රේණියේ)
  ii. වෙනත් බෝග - නොමැත
  iii. අපනයන කෘෂි බෝග - අපනයන බෝග වශයෙන් ගෘහ ආශ්‍රිතව කුරුඳු වගාවන් සිදුකරයි. මෙම වගාව අක්කර 03 ක පමණ භූමියක වගාවන් සිදුවන අතර ඔව්විවල් වල හා ඉඩම් මායිම් වලද මෙම වගාව දැකිය හැකිය.
  iv. භූමි යෙදවුම
    1. ගොඩ ඉඩම් - හෙක්ටයාර් 289.8
    2. මඩ ඉඩම් -
       - වී වගා කරන බිම් අක්කර 190 (A ශ්‍රේණිය)
       - පුරන් කුඹුරු බිම් අක්කර 159 (W ශ්‍රේණිය)
       - එළවලු බිම් අක්කර 07 (B ශ්‍රේණිය)
       - කීර බිම් අක්කර 08 (B ශ්‍රේණිය)
       - දෙනි, ඔවිට පර්චස් 80 (C ශ්‍රේණිය)
    3. පුරන් වූ/ අත්හැර දැමූ - අක්කර 61 (W ශ්‍රේණිය)

c) පසේ ස්වභාවය හා සාඵල්‍යතාව - පසේ ස්වාභාවය රතු කහ මිශ්‍ර පොඩ්සොලික් පසක් වන අතර මෙහි සාඵල්‍යතාවය ඉහල මට්ටමක පවතී.

d) පාංශු බාදනයේ ස්වභාවය - නිරන්තර ගංවතුර ගැලීම නිසා පාංශු බාදනය සිදුවේ.

e) පාංශු හායනයේ ස්වභාවය - මිනිස් ක්‍රියාකාරකම් හේතුකොටගෙන ඉතා සුළු වශයෙන් පාංශු හායනය සිදුවේ.

II. ජලජ සම්පත්

a) මතුපිට ජල මූලාශ්‍ර

- ගංගා - නොමැත
- අතු ගංගා/ ඔය/ දොළ - නොමැත
- ඇල මාර්ග - කළු ගඟ අතු ඔයෙහි අතු ඇලක් වශයෙන් මහ ඇල නිර්මාණය වී ඇත. මෙය කහතුඩුව බටහිර වසමෙන් පටන්ගෙන පාලගම පාලම අසලින් අවසන් වේ. මෙහි වසමට අයත් ප්‍රමාණයේ දිග km2 පමණ වේ.
- වැව්/ තටාක - නොමැත
- පොකුණු/ නිර්මිත පොකුණු (අත්හළ ගල්වල) - නොමැත
- දිය උල්පත් - නොමැත

b) භූගත ජලය

- ළිං - 847
- නළ ළිං - 2

c) වර්ෂාපතනය

- වාර්ෂික මධ්‍යනය වර්ෂාපතනය - 2608mm පමණ වේ
- වර්ෂා ක්‍රමය - මෙම ප්‍රදේශයට නිරිත දිග මෝසම් වැසි සහ ඊසාන දිග මෝසම් සක්‍රීය වන අවස්ථාවලදී වැසි ලැබේ.

d) වාරිමාර්ග කටයුතු

- මහා වාරි ව්‍යාපාර - වසම තුල නොමැත
- සුළු වාරි ව්‍යාපාර - වසම තුල නොමැත (මෙම වසමේ ගොවිතැන් සිදු කරනුයේ වර්ෂා ජලයෙනි. මේ සඳහා කුඩා අමුණු 02 භාවිතා කෙරේ.)

e) ජලයේ ගුණාත්මකබව - වසමේ ජලයේ ගුණාත්මක භාවය PH අගය 6.5-7.5 වන අතර ළිං වල PH අගය 7ට ආසන්න අගයක් ගනී.

f) ජල සුලබතාව -

- පවුල් 75% පමණ ජාතික ජල සම්පාදන මණ්ඩලයේ ජලය භාවිතයට ගනී.
- පවුල් 15% පමණ ළිං ජලය භාවිතයට ගනී.
- පවුල් 15% පමණ ජල සම්පාදන මණ්ඩලයේ හා ළිං භාවිතා කර ජලය ලබා ගනී.
- නළ ළිං - පවුල් 02
- පොදු ළිං - පවුල් 05 (මෙම වසමේ ජල හිඟතාවයක් නොමැති අතර දැඩි නියං තත්වයන් වලදි ළිං සිදීයාමක් දැකිය හැකිය).

III. වනාන්තර හා වනවගාවන්

a) වන වැස්මේ ව්‍යාප්තිය - මෙම වසම තුල වන වැස්මක් නොමැත.

b) සුලබ ශාක පිළිබඳ ලේඛනය

| ගස් වර්ගය | ප්‍රමාණය |
|---|---|
| • පොල් | 367 |
| • කොස් | 52 |
| • දෙල් | 15 |
| • පුවක් | 317 |
| • රබර් | 215 |
| • අඹ | 48 |
| • රඹුටන් | 15 |
| • කෙසෙල් | 625 |
| • කතුරුමුරුංගා | 92 |

c) දැවමය නොවන වන නිෂ්පාදන

- ආහාර හා ආකලන - ගම්මිරිස්, ඉඟුරු, කහ
- දේශීය ඖෂධ - හීන්බෝවිටියා, මොනරකුඩුම්බිය, කෝමාරිකා, අක්කපාන, පාවට්ටා
- ශාකසාර - නොමැත
- අත්කම් අමුද්‍රව්‍ය - උණ, පන් වර්ග
- ඉදිකිරීම් අමුද්‍රව්‍ය - පොල්, කොස්, පුවක්
- සැරසිලි හා සංස්කෘතික වටිනාකම් සහිත ද්‍රව්‍ය - පිහිඹියා, පෝටා වැල්,හාතාවාරිය

d) වන විනාශකිරීම් පිළිබඳ විස්තර - වාර්තා නොවේ

e) වනවගා ව්‍යාපෘති විස්තර - විස්තර නොමැත

f) වන සංරක්ෂණ ප්‍රයත්න - විස්තර නොමැත

IV. ජෛව විවිධත්වය

a) ශාක ලේඛනය

- කොස්
- පොල්
- දෙල්
- මහෝගනී
- කුඹුක්
- තේක්ක
- රඹුටන්
- අඹ
- ගොරකා
- බෙලි
- අලිපේර
- අනෝදා
- ගොරකා
- වෙරලු
- කොහොඹ
- රබර්
- ගොඩපර
- වල්දෙල්

b) ශාක වර්ගීකරණය

| දේශීය ශාක | ඒක දේශීය ශාක | හඳුන්වාදුන් විදේශීය/ දේශීය | ස්වභාවීකෘත විදේශීය/ දේශීය | ආගන්තුක | ආගන්තුක ආක්‍රමණශීලී |
|---|---|---|---|---|---|
| හොර | ගොඩපර | ඇකේෂියා | - | ගඳපාන | යෝද නිදිකුම්බා |
| කොහොඹ | බෙලි | රබර් | | | |
| බුරුත | ඇඹරැල්ලා | තේ | | | |
| වෙරලු | හල් | බඩඉරිඟු | | | |
| කොස් | කෙසෙල් | | | | |
| වල්දෙල් | කොස් | | | | |
| හීන්බෝවිටියා | පොල් | | | | |
| කදුරු | | | | | |

c) අන්තරායට ලක්වූ කාණ්ඩ

- ඉරමුසු
- බිං කොහොඹ
- සඳුන් (සුදු සඳුන් / රත් සඳුන්)

4. පරිසරය හා සම්බන්ධ මානව ක්‍රියාකාරකම්

I. කෘෂිකර්මය

a) ප්‍රධාන භෝග (වී)

මෙම වසම තුල අක්කර 190 භූමි ප්‍රමාණයක වී වගාව සිදුකරන අතර ගොවිපවුල් 165 පමණ ජීවත් වේ.

b) අතිරේක භෝග (ධාන්‍ය හා ආහාර බෝග වර්ග)

අතිරේක භෝග වශයෙන් ආහාර බෝග වගා කෙරේ. එනම් කීර අක්කර 08 කද මඤ්ඤොක්කා අක්කර 15 කද එළවලු අක්කර 15 වගා කෙරේ. ඒ අනුව අක්කර 38 ක ආහාර බෝග වගා කරන අතර ධාන්‍ය බෝග වගා නොකෙරේ.

c) අපනයන භෝග (තේ/පොල්/රබර්)

අපනයන බෝග ලෙස ගෘහ ආශ්‍රිතව පොල් අක්කර 3 කද රබර් අක්කර 3 කද වගාකර ඇති අතර තේ වගාවන් වසම තුල දැකිය නොහැක.

d) සුළු අපනයන භෝග/ අපනයන කෘෂි බෝග (ඇමුණුම 01)

කුරුඳු අක්කර 03 පමණ ගෘහ ආශ්‍රිතව වගාකර ඇති අතර කහ, ගම්මිරිස් සුළු වශයෙන් වගාකර ඇත.

e) වෙනත් වානිජ භෝග (පාම්/අගාවුඩ් ආදිය) - අදාල නැත.


f) රසායනික පොහොර යෙදවුම (ප්‍රස්තාර සහිතව)

වී වගාව හා එළවලු වගාව සඳහා රසායනික පොහොර නිරන්තරයෙන් භාවිතා වේ. එනම් TSP පොහොර, යූරියා පොහොර, MOP පොහොර බහුලව භාවිතා වේ. පොල් හා රබර් වගාවන් සඳහා ද රසායනික පොහොර භාවිතය වැඩිවෙමින් පවතී.




g) කෘමි/ පළිබෝධ නාශක යෙදවුම (ප්‍රස්තාර සහිතව)

වසමේ ඇති වී, පොල්, රබර්, එළවලු ඇතුලු සියලු වගාවන් ආරම්භයේ දී වල්නාශක යොදා ගන්නා අතර ගෙඩි සහ කරල් අවදිවලදී කෘමිනාශක භාවිතා කෙරේ.




h) සම්ප්‍රදායික කෘෂිකාර්මික පිළිවෙත්

වසම තුල සම්ප්‍රදායික කෘෂි පිළිවෙත් දැකිය හැක. එනම්,

- වී ගොවිතැනේ දී කුඹුරේ වල් මැරීම සඳහා වල්පැළෑටි වතුරෙන් යට කරනවා.
- මී හරක් යොදා කුඹුරු හෑම.
- මිනිස් ශ්‍රමය යොදා බිම් සැකසීම.
- ගොයම් පැල මිනිස් ශ්‍රමය යොදා සිටුවීම.
- ඇහැල පුස්ස බලා පැල සිටුවීම සිදුකරයි.
- ගොයම් කපන මාසේදී පොහොයට පෙර ගොයම් කපා අවසන් කෙරේ.
- කෘමීන්ගෙන් වන හානිය සඳහා ග්‍රීස් මිශ්‍ර ඉටිකොළ පටි සිටුවීම.
- වී වගාව සිදුකිරීමේදී ලියැද්දක කොටසක් කලින් සිටුවීම.
- ගොයම් කපා අවසානයේ දේව දානය දීම.

i) නවීන කෘෂිකාර්මික පිළිවෙත්

වසම තුල නවීන කෘෂිකාර්මික පිළිවෙත් දැකිය හැක. එනම්,

- පැරශුට් ක්‍රමයට පැල සිටුවීම.
- නව දෙමුහුන් බීජ වී ප්‍රභේද හඳුන්වා දීම.
- අලුත් යන්ත්‍රෝපකරණ හඳුන්වා දීම.
- නවීන කෘෂිකාර්මික යෙදවුම් භාවිතා කිරීම.

j) යහපත් කෘෂිකාර්මික පිළිවෙත් (GAP)

වසම තුල යහපත් කෘෂිකාර්මික පිළිවෙත් දැකිය හැක. එනම්,

- පස් පරීක්ෂාවෙන් පසු පසට අදාල පොහොර භාවිතා කිරීම.
- පාංශු ඛාදනය අවම වන පරිදි පස සැකසීම.
- කන්න මාරු ක්‍රමයට බෝග සිටුවීම.
- ගුණාත්මක භාවය වැඩි බීජ වර්ග භාවිතය

- රසායනික ද්‍රව්‍යය වෙනුවට කෘමි ප්‍රතිරෝධී දැල් හා කෘමි උගුල් භාවිතා කිරීම හෝ රෝගවලට ඔරොත්තු දෙන ප්‍රභේද වගා කිරීම.
- අස්වැන්න නෙලීමෙන් පසු නිවැරදිව ගබඩා කර තැබීම.
- වගා කටයුතු කිරීමේදී ගොවි මහතුන් සෞඛ්‍යය ආරක්ෂක විදි අනුගමනය කිරීම.

k) කෘෂිකර්මාන්තය කෙරෙහි වන අභියෝග හා දුෂ්කරතා (ස්වභාවික ආපදා/ කෘමි හා පළිබෝධ බලපෑම්)

- නිරන්තරයෙන් ගංවතුරෙන් වන වගා හානිය
- කාලගුණ දේශගුණ වෙනස්වීම නිසා ඇතිවන වගා හානිය.
- සතුන් මගින් සිදුවන වගා හානිය.
- ක්ෂනිකව ඇතිවන කෘමි උවදුරු හා දිලීර රෝග නිසා සිදුවන වගා හානිය.

II. පශු සම්පත් කර්මාන්ත

a) සුලබ පශු කර්මාන්ත යෙදවුම් (ගව/ මීගව/ එළු/ කුකුළු/ වෙනත්)

b) පශු කර්මාන්තය සඳහා යෙදෙන ආහාර පිළිබඳ විස්තරය (ස්වාභාවික/ කෘත්‍රිම/ මිශ්‍ර)

| නම | ගව | මීගව | එළු | කුකුළන් | ආහාර | අරමුණු |
|---|---|---|---|---|---|---|
| ඒෂාන් එරංග | 07 | 20 | 20 | - | මිශ්‍ර | කිරි ලබා ගැනීම, අලෙවිය |
| ශෙහාන් දිනුක | - | - | 03 | - | මිශ්‍ර | කිරි ලබා ගැනීම, අලෙවිය |
| අනුර බුද්ධික | - | - | 05 | - | මිශ්‍ර | කිරි ලබා ගැනීම, අලෙවිය |
| ඒ. නයනා | - | - | - | 10 | මිශ්‍ර | බිත්තර ලබා ගැනීම, අලෙවිය |
| අශානි මදූරිකා | - | - | - | 10 | මිශ්‍ර | බිත්තර ලබා ගැනීම, අලෙවිය |
| මදූෂ්ක දනංජය | - | - | - | 10 | මිශ්‍ර | බිත්තර ලබා ගැනීම, අලෙවිය |
| නිලා සමන්තිකා | - | - | - | 10 | මිශ්‍ර | බිත්තර ලබා ගැනීම, අලෙවිය |

c) පශු වෛද්‍යමය සාධක (රෝග ආදිය)

මෙම වසම තුල සත්වයන් සඳහා පහත සඳහන් රෝග දැකිය හැක.

- කුර රෝග (එළුවන් ගවයන් සඳහා)
- මුඛ රෝගය (එළුවන් ගවයන් සඳහා)
- රැනිකට්/ කුකුළු වසූරිය (කුකුලන් සඳහා)

III. ධීවර කර්මාන්තය

a) ප්‍රධාන ධීවර අයිතම (මත්ස්‍ය වර්ග) - වසමේ නොමැත

b) ධීවර කාර්මික පරිවාර (සම්ප්‍රදායික බිලිබෑම/ දැල් දැමීම/ නවීන ක්‍රම ආදිය) - වසමේ නොමැත


c) ධීවර කර්මාන්තය කෙරෙහි වන අභියෝග හා දුෂ්කරතා - වසමේ නොමැත

IV. ශක්ති ප්‍රභව

a) ප්‍රධාන ශක්ති ප්‍රභව වර්ගීකරණය (ප්‍රස්තාර සහිතව)


- පුනර්ජනනීය ශක්ති ප්‍රභව

  මෙම වසම තුල පුනර්ජනනී ශක්ති ප්‍රභවය ලෙස සෝලා පැනල් භාවිතා කිරීම දැකිය හැක. මෙය 10% ප්‍රතිශතයකින් යුක්ත වේ.





- පුනර්ජනනීය නොවන ශක්ති ප්‍රභව

  පුනර් ජනනීය නොවන ශක්ති ප්‍රභව ලෙස සැලකෙන්නේ නැවත නැවත උත්පාදනය කළ නොහැකි භාවිතයන් සමග අවසන් වන ශක්ති මූලාශ්‍රයන්ය. මෙම වසම තුල පුනර්ජනනී නොවන ශක්ති ප්‍රභව ලෙස පෙට්‍රල්, ඩීසල්, ගෑස්, දර භාවිතා කරයි.




- ඉල්ලුම් සැපයුම් පුනර්ජනනීය




b) ස්වභාවික ශක්ති සම්පත් කෙරෙහි වන ඉල්ලුම හා සැපයුම් අනුපාත විශ්ලේෂණය

මෙම වසමේ ජනගහනය වැඩිවීමත් නව කර්මාන්ත ඇතිවීමත්, නව තාක්ෂණය භාවිතාව වැඩිවීමත් සමග ස්වභාවික ශක්ති සම්පත් වලට ඇති ඉල්ලුම ඉහල යයි.

මෙම ඉල්ලුමට සාපේක්ෂව සම්පත් සීමිත බැවින් ද පුද්ගල අවශ්‍යතා අසීමිත බැවින් ද සැපයුමට සාපේක්ෂව ඉල්ලුම ඉහල අගයක් ගනී.

මෙම වසමේ අනුපාත සමස්ථයක් වශයෙන් ගත් කල විශ්ලේෂණය ඉල්ලුමට සාපේක්ෂව සැපයුම අඩු අගයක් ගන්නා බව පෙනීයයි.




c) පුනර්ජනනීය ශක්ති ප්‍රභව යෙදවුම් සඳහා ප්‍රජාවේ දායකත්වය

මෙම වසමට අදාලව පුනර්ජනනීය ශක්ති ප්‍රභව යෙදවුම් සඳහා ප්‍රජාවගේ දායකත්වය ලෙස සෝලා පැනල් භාවිතයට ඇති ඉල්ලුම දැකගත හැක. නමුත් මේ සඳහා දැරීමට වන අධික පිරිවැය ඉතා ඉහල අගයක් ගනී. මේ නිසා ඉල්ලුම් කරුවන්ගේ කැමැත්ත සඳහා අඩු උපයෝගීතාවයක් ඇති වෙයි.

5. සමාජ-සංස්කෘත සන්දර්භය

ගැටලු

I. පරිසර ගැටළු පිළිබඳ ප්‍රජාවේ අවබෝධය හා විසඳුම් යෝජනාකරණ යන්ත්‍රණය

- ජෛව විවිධත්වය හානිවීම නිසා සත්ව සම්පත හා ශාක සම්පත විනාශ වීම
- නාගරීකරණය වීම නිසා ශබ්ද, දූෂණය හා වාතය, ජලය දූෂණය වීම.
- ඉඩම් කැබලි වීම නිසා කසල කළමනාකරණ ගැටලු මතුවීම.
- ජල බැස්මවල් හා කාණු පද්ධති නිසි නඩත්තු නොවීම නිසා ගංවතුර නිරන්තරයෙන් ඇතිවීම.
- ඉඩම් කැබලි වීමේ ප්‍රවනතාවයට සාපේක්ෂව යටිතල පහසුකම් සංවර්ධනය නොවීම

විසඳුම්

- වසම තුල හඳුනාගත් මෙම ගැටලු හා විසඳුම් ක්‍රියාවට නැංවීමට ග්‍රාමීය ප්‍රජා මට්ටමෙන් යාන්ත්‍රනයක්ද, රාජ්‍යය මට්ටමින් යාන්ත්‍රනයක්ද, ජාත්‍යාන්තර මට්ටමින් යාන්ත්‍රනයක්ද වසම තුල හඳුන්වාදීමට යෝජනා කෙරේ.
- අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණ පිළිබඳ වැඩසටහන් පවත්වා ජනතාව දැනුවත් කිරීම.
- පොදු ස්ථානවල අපද්‍රව්‍යය බැහැර කිරීම වැළැක්වීමට රජයේ නිලධාරීන් මැදිහත් වී නීතිය ක්‍රියාත්මක කිරීම.
- Clean ශ්‍රී ලංකා වැඩසටහන තුලින් කසල කළමනාකරණය හා පවිත්‍රතා පිළිබඳ වැඩසටහන් ක්‍රියාවට නැංවීම.
- ප්‍රජා දායකත්වයෙන් වීදි නිරන්තරයෙන් පිරිසිදු කිරීම.
- ගොවිජනතාවට කාබනික පොහොර භාවිතයට හුරු කිරීම.

II. සම්ප්‍රදායික පරිසර දැණුම හා පරිචාර

පරම්පරාගතව බෙදාගනු ලැබූ පරිසර දැනුම හා පරිචාර කට වචනයෙන් ද දේශීය දැනුමෙන්ද ජනවිශ්වාසයෙන්ද ආගම් සම්ප්‍රදායන්ද ජාතීන්ගේ චාරිත්‍ර වාරිත්‍ර වල එකතුවෙන් මෙම සංකල්පය වසම තුල දැකිය හැක.

උදා :- බෝ ගසට, නා ගසට ගෞරව කිරීම.

බෝ නොවන රෝග පාලනයට දේශීය ශාඛ භාවිතය

නිදන්ගත රෝගවලට ශාන්තිකර්ම පැවැත්වීම.

හිරුදෙවි නමස්කාරය

බෝ වන රෝග ව්‍යාප්තිය අවම කිරීමට ශාඛ සංඥා ක්‍රම භාවිතය

ජනකතා, ජනකවි, විශ්වාස පරම්පරාගතව පැවත ඒම.

III. සම්ප්‍රදායික ජන කණ්ඩායම් හා පරිසර අභිවරණය

a) ජනප්‍රවාද
b) ජනශෘතිය
c) දේශීය වෛද්‍ය ක්‍රම

මිනිසුන් පරිසරයට අනුව තම ජීවන රටාව සකසාගෙන ඇත. මෙහිදී විශේෂයෙන් කෘෂිකර්මාන්තය මුල්කරගෙන කෘෂිකර්මාන්තයේ යෙදෙන උදවිය අහස දෙස බලමින්, සතුන්ගේ හැසිරීම් අනුව කෘෂිකර්මාන්තයේ යෙදීම පෙන්වා දිය හැක.

එසේම මෙම වසම තුල සම්ප්‍රදායික ජන කණ්ඩායම් දැකිය නොහැක.

IV. පරිසර ගැටළු සඳහා යෙදුණු විසඳුම්/විකල්ප

| ගැටළුව | විසඳුම් හා විකල්ප |
|---|---|
| i. වායු දූෂණය | • දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාවට නැංවීම<br>• පුනර්ජනනීි ශක්ති ප්‍රභව හඳුන්වාදීම<br>• කර්මාන්ත ශාලාවලින් පිටවන දුම් පාලනය කිරීම<br>• ප්‍රවාහන පද්ධතිය යාවත්කාලීන කිරීම.<br>උදා:- ප්‍රවාහනය විදුලිය මූලික කරගෙන සිදුකිරීම. |
| ii. ජල දූෂණය | • දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාවට නැංවීම.<br>• දැඩි දඬුවම් ක්‍රියාවට නැංවීම.<br>• කාබනික පොහොර භාවිතය හුරු කිරීම.<br>• ජලය පවිත්‍ර කිරීමට නව තාක්ෂණය භාවිතාව<br>• අපද්‍රව්‍යය ජලයට මුදා හැරීමට පෙර ප්‍රතිචක්‍රීයකරණය කිරීම. |
| iii. ඉඩම් කට්ටි කිරීම නිසා ඇතිවන පාරිසරික ගැටලු | • ඉඩම් කැබලි කිරීමේදී නීතිය දැඩිව ක්‍රියාවට නැංවීම<br>• ඉඩම් භාවිත සැලසුම් නිවැරදි කිරීම<br>• නවීන තාක්ෂණය යොදාගෙන ඉඩම් සංවර්ධනය කිරීම. |
| iv. අපද්‍රව්‍යය බැහැර කිරීමේ ගැටලුව | • 3R ක්‍රමය භාවිතයට ජනතාව දැනුවත් කිරීම.<br>• අපද්‍රව්‍යය වෙන් කිරීම<br>• වසම තුල පිරිසිදු කිරීමේ වැඩසටහන් ක්‍රියාවට නැංවීම. (මේ සඳහා ප්‍රාදේශීය සභාව සක්‍රියව දායක කරගැනීම) |

6. කාලීන පාරිසරික අර්බුද හා අභියෝග

I. වන විනාශය/ කැළෑ එළිකිරීම - අදාල නොවේ

II. ජල හිඟය - නියන් කාලවලදී ළිං හිඳී යයි

III. පාංශු හායනය - මෙම වසම නිරන්තර ගංවතුර තර්ජනයට ලක්වීම හා මිනිස් ක්‍රියාකාරකම් හේතුවෙන් පාංශු හායනයට ලක් වේ.

IV. කැලි-කසල බැහැර කිරීම

මෙම වසමේ ඉඩම් මේ වන විට වෙන්දේසි වීම නිසා කුඩා භූමි ප්‍රමාණවල විශාල ජන ගහනයක් වාසය කිරීම නිසා අවිධිමත් කසල බැහැර කිරීම නිරන්තරයෙන් දැකිය හැකිය. එසේම ප්‍රාදේශීය සභාවෙන් කසල එකතු කිරීමට දක්වන සහයෝගය ප්‍රමාණවත් නොවේ.

V. දේශගුණික විපර්යාසවල බලපෑම

ලෝක මට්ටමින් සිදුවන කාලගුණ දේශගුණ විපර්යාස නිසා මෙම වසමේ උෂ්ණත්වය, වර්ෂාපතනය, සුළං වැනි ප්‍රධාන සාධක නිරන්තරයෙන් වෙනසකට භාජනය වේ. මෙම හේතුව නිසා කෘෂිකාර්මික වසමක් වන මෙම වසමේ කෘෂිකර්මාන්තයට මෙම බලපෑම සෘජුවම දැනේ.

VI. ආගන්තුක හා ආගන්තුක-ආක්‍රමණශීලී විශේෂවල බලපෑම

නිරන්තරයෙන් ගංවතුර පැමිණෙන වසමක් වීම හේතුවෙන් වැව් රක්ෂිතයේ හා වැව තුල යෝද නිදිකුම්බා ව්‍යාප්ත වී ඇත. මේ හේතුවෙන් කෘෂිකර්ම කටයුතු හා ජලබැස්මට මහත් තර්ජනයක් වී ඇත. මෙයට අමතරව ගංවතුරෙන් බීජ ව්‍යාප්ත වන නිසා සෙසු වසම්වලට මෙයින් බලපෑමක් ඇතිවේ.

7. පාරිසරික තිරසර සංවර්ධන අභිමතාර්ථ සපථ කර ගැනීම (ඇමුණුම 02)

I. අභිමතාර්ථ අංක 06 - පිරිසිදු පානීය ජලය හා සනීපාරක්ෂාව

මෙම වසම සීඝ්‍රයෙන් නාගරීකරණය වීම නිසා ජල පරිභෝජන අවශ්‍යතාව ඉහළ අගයක් ගනී. එසේම අපද්‍රව්‍යය මුදාහරින ක්‍රමවේදය නියමිත ප්‍රමිතියෙන් තොර වීම නිසා සනීපාරක්ෂාවට තර්ජනයක් වේ. තවද මෙම වසම තුල සීඝ්‍රයෙන් ඉදිවන කර්මාන්ත නිසා එයින් මුදාහරින අපද්‍රව්‍යය හේතුවෙන් ළිං, ඇලවේලි ඇති ජලය අපවිත්‍රවීමට සෘජුවම බලපායි. මේ සඳහා පහත සඳහන් යෝජනා නිර්දේශ කරමි.

- ජලය භාවිතා කිරීමේ වැදගත්කම පිළිබඳ ප්‍රජාව දැනුවත් කිරීම.
- ප්‍රජාවට ජලය හා සනීපාරක්ෂාව පිළිබඳ දැනුවත් කිරීම.
- ජල භාවිතය, ජල ඉතිරිය හා ජල වියදම අවම කිරීම පිළිබඳ ප්‍රජාව දැනුවත් කිරීම.
- ජල මූලාශ්‍ර ආරක්ෂා කරමින් සියලු ගම්වාසීන්ට පිරිසිදු ජලය ලබා දීම.
- වගාවන් සඳහා ඵලදායී ජල භාවිතා ක්‍රම හඳුන්වාදීම.

සනීපාරක්ෂාව

සනීපාරක්ෂක පහසුකම් අවම පවුල් සඳහා සෞඛ්‍යය ආරක්ෂිත වැසිකිළි පද්ධතියක් සැකසීම හා වසමේ පොදු ස්ථාන මුල්කර ගෙන සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීම. එසේම මේ පිළිබඳව ගම්වාසීන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.

II. අභිමතාර්ථ අංක 07 - ධරණීය හා සුනිත්‍ය බලශක්තිය

සෑම පුද්ගලයෙකුටම අඩු වියදමින් හිතකාමී බලශක්ති ක්‍රමයක් කාර්යක්ෂමව හා ගුණාත්මකව ළඟා කර දීම මෙමගින් අපේක්ෂා කෙරේ.

- ධරණීය බලශක්ති

  මෙම බලශක්තිය පරිසර හිතකාමී වන අතර මේ සඳහා භාවිතා වන ශක්ති ප්‍රභවයන් සුලභව වසම තුල ලබාගත හැකි අතර මෙය දිගුකාලීන ආයෝජනයක්ද වේ. මෙම වසම තුල ධරණී බලශක්තියක් ලෙස සෝල පැලේ භාවිතයට වැඩි ඉඩක් ඇති බව පෙනී යයි.

- සුනිත්‍ය බලශක්ති

  මෙම වසමේ වැඩි වශයෙන් සුනිත්‍ය බලශක්තිය භාවිතා කෙරේ. මෙම බලශක්තිය උපරිම කාර්යක්ෂම තාවයෙන් යුක්තව අවම පිරිවැයක් යටතේ පරිසර හිතකාමීව වසම තුල භාවිතා වේ. සමස්ථයක් වශයෙන් ගත්කල ධරණී බලශක්තිය හා සුනිත්‍ය බලශක්ති වල සංකලනයක් වසමට හඳුනා දුනහොත් තිරසාර සංවර්ධනයක් උදාවේ.

III. අභිමතාර්ථ අංක 12 - තිරසර පරිභෝජන හා නිෂ්පාදන රටාවන්

පරිසරය සුරක්ෂිත වන අන්දමින් ස්වභාවික සම්පත් කළමනාකරණය කරමින් භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කිරීම මෙහි ප්‍රධාන අරමුණ වේ. වසමේ මෙම නිෂ්පාදන ප්‍රවර්ධනය, පරිභෝජනය වසමේ සංවර්ධනයට ඉවහල් වේ. වසමේ සියලුම ජනතාවගේ මූලික අවශ්‍යතා සපුරාලමින් ජීවන තත්ත්වය නංවාලමින් පරිසර හිතකාමී ලෙස ආර්ථික සංවර්ධනය ළඟාකර ගැනීමට තිරසාර පරිභෝජනය සහ නිෂ්පාදන රටා ඉවහල් වේ.

මෙහි ප්‍රධාන අරමුණු ලෙස පරිසර හිතකාමී ක්‍රම හඳුන්වාදීම, නිෂ්පාදනවල ආයුකාලය දිගු කිරීම, පාරිභෝගික සදාචාරය ඇතිකිරීමට ප්‍රතිශක්තිකරණය හා නැවත භාවිතය ඇතිකිරීම හා සම්පත් කාර්යක්ෂම භාවිතය. මෙහි ප්‍රධාන අරමුණු ලෙස පෙන්වා දිය හැක.

IV. අභිමතාර්ථ අංක 13 - දේශගුණික විපර්යාස හා ඒවායේ බලපෑම්

මෙම වසමේ බොහෝ පවුල් කෘෂිකාර්මික පවුල් වන අතර දේශගුණික විපර්යාස හේතුවෙන් වාගවන්ට නිරන්තර හානි සිදුවේ. මහවැසි හේතුවෙන් ඇතිවන ගංවතුර තත්වයන් හා වියලි කාලවලදී සිදුවන වගා හානි නිතර දැකිය හැක.

මෙම දේශගුණික විපර්යාස නිසා ජලය හිඟවීම ජල ගැලීම් ඇතිවීම, උෂ්ණත්වය ඉහල යෑම, ජලය හිඟවීම, සත්ව හා ශාඛ වර්ග විනාශ වීම, රෝග ව්‍යාප්තිය ඇතිවීම, නිරන්තරයෙන් වසම තුල දැකිය හැක.

V. අභිමතාර්ථ අංක 14 - සාගර සම්පත් සංරක්ෂණය හා පිරිමැසුම්දායක භාවිතාව - අදාල නොවේ.

VI. අභිමතාර්ථ අංක 15 - භෞම පරිසර පද්ධතීන් සංරක්ෂණය හා තිරසර භාවිතාව

පරිසර පද්ධති තිරසාරව භාවිතා කිරීමෙන් පසුව පරිසරය සුරැකේ. මේ සඳහා ප්‍රජාව දැනුවත් කළ යුතුය. මේ සඳහා වසමේ ක්‍රියාකාරකම් කිරීමට යෝජනා කෙරේ.

- වසමේ යෝද නිදිකුම්බා ව්‍යාප්තිය පාලනය කිරීම.
- ජෛව විවිධත්වය ආරක්ෂා කිරීම.
- සත්ව හා ශාකවල සුරක්ෂිත භාවය තහවුරු කිරීම.
- ජල පෝෂිත ප්‍රදේශ ආරක්ෂා කිරීම.

8. තිරසර පරිසර සංවර්ධනය හා පරිසර කළමනාකරණ යන්ත්‍රණයක් ස්ථාපිත කිරීම සඳහා නව අදහස්, යෝජනා හා නිර්දේශ

i. තිරසර පරිසර සංවර්ධනය හා පරිසර කළමනාකරණ පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් සැකසිය යුතු වේ. මෙම ජාතික ප්‍රතිපත්තිය කෙටිකාලීන හා මධ්‍යය කාලීන හා දිගු කාලීන වශයෙන් තිරසර සංවර්ධන ඉලක්ක ප්‍රමුඛතා ගතකොට ක්‍රියාත්මක කරලීම කලයුතු වේ.

ii. ඉහත ප්‍රතිපත්තිය සියලු පාර්ශවයන්ගේ එකඟතා මත පරිසර හිතකාමී හරිත ප්‍රතිපත්තියක් නිර්මාණය කිරීම.

iii. පරිසර සංරක්ෂණ නීති ඉදිකිරීම් පිළිබඳ ප්‍රමිතීන් සක්‍රීයව ක්‍රියාවට නැංවීම.

iv. අපද්‍රව්‍යය විධිමත්ව බැහැර කිරීම රසායනික පොහොර හා කෘමිනාශක භාවිතය අවම කිරීමේ වැඩසටහන් සඳහා ප්‍රජා දායකත්වය ඉහල නංවා ගැනීම.

v. ප්ලාස්ටික් පොලිතීන් ප්‍රතිචක්‍රීයකරණ වැනි පරිසර හිතකාමී ආයෝජන අවස්ථා ඇති කිරීම.

vi. වැඩිදියුණු කල පැල හා බීජ හඳුන්වාදීම.

vii. නවීන තාක්ෂණය භාවිතා කර පශු සම්පත් වැඩිදියුණු කිරීම.

viii. වැසි ජලය කළමනාකරණය සඳහා වසම තුල පොදු වැඩසටහනක් ක්‍රියාවට නැංවීම.

ix. පිරිසිදු ජලය හා සනීපාරක්ෂාව ප්‍රශස්ථ මට්ටමකට ගෙන ඒමට සැලසුම් සැකසීම

x. ක්‍රමවත් පාරිභෝජන රටාවන් වසම තුල ඇති කිරීම.

xi. ස්වභාවික සම්පත් ඵලදායීව යොදා ගනිමින් හරිත රැකියාවන් ඇති කිරීම.

xii. පරිසර හිතකාමී බලශක්ති ප්‍රභවයන් වසමට හඳුන්වා දීම.

9. ඇමුණුම්

I. සිතියම් I/II ඇමුණුමට අදාල වේ.

II. රූප සටහන් නොමැත

III. ප්‍රජා සහභාගීකව පර්යේෂණ/ සමීක්ෂණ ලෙස

මෙම වසමේ විහාරාධිපති හිමියන්, විශ්‍රාමික විදුහල්පති මහත්මයෙක්ද, පාරම්පරික වෙද මහත්මයෙක්ද වයසින් වැඩි වැඩිහිටි කිහිප පොලක්ද සහභාගීත්වයෙන් වසම පිළිබඳ කරුණු අධ්‍යයනය කළහ.

10. විමර්ශන

ජනගහනය - 2024 ඡන්ද හිමි නාමලේඛනය පදනම් කරගෙන

කාලගුණ දේශගුණික තොරතුරු - කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ අන්තර්ජාල තොරතුරු මගින්


භෞමික සම්පත් තොරතුරු - වසමේ කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාරිවරියගේ තොරතුරු මගින්

ශාඛ ලේඛනය - Food gate සමීක්ෂණ තොරතුරු මගින්

සිතියම් - අන්තර් ජාලය මගින්

11. වසම පිළිබඳ

601 - වෙනිවැල්කොල ග්‍රාම නිලධාරී වසමේ සිතියම




හෝමාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අර්ධ නාගරික වසමක් ලෙස වෙනිවැල්කොල වසම හඳුනාගත හැකි අතර මෙම බල ප්‍රදේශය ශීඝ්‍රයෙන් නාගරීකරණයට ලක් වෙමින් පවතී. දක්ෂිණ අධිවේගී මාර්ගයේ පිවිසුමට ආසන්නයේ පිහිටි වසමක් වන බැවින් පදිංචිය සඳහා සුදුසු පරිසරයක් ද පවතී. එම නිසා තදාසන්න ප්‍රදේශ වල සිටින ජනයා මෙම වසමට සංක්‍රමණය වීම හේතුවෙන් ඉඩම් කට්ටි වීමේ ප්‍රවනතාවයක් දක්නට හැකිය.

මෙම වසමේ වගාකරන මුළු කුඹුරු අක්. 190 ක් පමණ පවතින අතර වගා නොකරන පුරන් කුඹුරු අක්. 159 ක් පමණ ඇත. වසමේ ගොඩබිම් බෝග ලෙස පොල් අක්. 20 ක්, රබර් අක්. 10 ක්, එළවලු අක්. 09 ක් ද, පළතුරු අක්. 06 ක් ද, අල වර්ග අක්. 15 කද සුළු අපනයන භෝග අක්. 02 කද, වගා කෙරෙති. මෙහි ගෙවතු වශයෙන් වගාකර ඇති බිම් ප්‍රමාණය පර්. 2000 ක් පමණ ඉක්මවා ඇත. එසේම වසම තුල ගොවි මහතුන් 150 ක් පමණ සිටින අතර ඇලවේලි 21 ක් හා අමුණු 03 කින් මෙම වසම සමන්විත වේ.

දක්ෂිණ අධිවේගී මාර්ගයේ පිවිසුම වසමට ආසන්නයේ පිහිටා ඇති බැවින් ප්‍රධාන මාර්ග පද්ධතිය යම් මට්ටමක දියුණුව පැවතියද අතුරු මාර්ග පද්ධතිය ඉතා ඉහල මට්ටමක පවතී. එසේම මෙම වසම තුල ගමනාගමන පහසුකම් ජනගහනයට සාපේක්ෂව ප්‍රමාණවත් නොවේ.

මෙම වසමේ බෞද්ධ විහාරස්ථාන 04 ක් පවතින අතර විශේෂ අවශ්‍යතා ඇති දරුවන් සඳහා පාසලක්ද, පෙර පාසල් 02 ක්ද, රජයේ පේෂකර්ම මධ්‍යස්ථානයක්ද පවතින අතර පෞද්ගලික සේවා සපයන ආයතන සහ කර්මාන්ත ස්ථාපිතව පවතී.

නාගරීකරණය වීම හේතුවෙන් ඉඩම් කට්ටි වී ඉඩම් කුඩා වී ඇත. එසේම ඉඩම් මිලදී ගැනීම සීඝ්‍රයෙන් ඉහල ගොස් ඇති අතර මෙයට සමගාමීව පොදු පහසුකම් හා අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ ගැටළු ඉහල ගොස් ඇත. එමෙන්ම සේවා ව්‍යුක්තියද ඉහල මට්ටමක පවතින අතර රාජ්‍ය අර්ධ රාජ්‍ය පෞද්ගලික හා ස්වයං රැකියාවන්හි නියුක්ත වූවන්ගෙන් මෙම වසම සමන්විත වේ.

වසමේ ඓතිහාසික සහ සංස්කෘතික පසුබිම - Cross Section of the GN Division

හෝමාගම ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ අයත් වන්නේ කොළඹ දිස්ත්‍රික්කයට වන අතර ශ්‍රී ලංකාවේ අග නගරයට තදාසන්නයේ පිහිටි මෙම බල ප්‍රදේශය ඉතිහාසය ඈත අතීතයට දිව යයි. 6 වන පරාක්‍රමබාහු රජ දවස කෝට්ටේ රාජධානියට අයත් ප්‍රදේශයක් වූ මේ හෝමාගම ප්‍රදේශය රාජකීයත්වයෙන් හා ශ්‍රී විභූතියෙන් පිරුණු ඓතිහාසික ප්‍රදේශයකි.

එවන් බල ප්‍රදේශයක පිහිටි වෙනිවැල්කොල ග්‍රාම නිලධාරී බල ප්‍රදේශයද ඓතිහාසික මතක සටහන් බොහොමයක් ඇති ගම්මානයකි. වෙනැවැල් නම් පලා වර්ග මෙම ප්‍රදේශයේ බහුල වූ නිසා මෙම ප්‍රදේශය වෙනිවැල්ල ප්‍රදේශය ලෙස හඳුන්වන ලදී. පසු කාලීනව මෙම ගම්මානය වෙනිවැල්කොල නමින් ප්‍රසිද්ධ විය.

මෙම වසම කෘෂිකාර්මික කටයුතු කරන ගම්මානයකි. මෙහි බහු ජාතීන් හා බහු ආගමිකයන් සංහිඳියාවෙන් වාසය කරන අතර බහු ආගමික හා ජාතික උත්සව නිරන්තරයෙන් වසම තුල පවත්වනු ලැබේ.

වසමේ සාමාන්‍යය කාලගුණික සහ දේශගුණික තත්ත්වය - Weather and Limatic Condition පහත පරිදි ඉදිරිපත් කළ හැක.

| සංරචකය<br>Indicator | ජන:<br>Jan | පෙබ:<br>Feb | මාර්තු<br>Mar | අප්‍රේ:<br>Apr | මැයි<br>May | ජුනි<br>June | ජූලි<br>July | අගෝ:<br>Aug | සැප්:<br>Sep | ඔක්:<br>Oct | නොවැ:<br>Nov | දෙසැ:<br>Dec |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|

| | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| වර්ෂාව Rainfall (mm) | 50 mm | 40 mm | 150 mm | 200 mm | 220 mm | 300 mm | 350 mm | 320 mm | 270 mm | 150 mm | 200 mm | 100 mm |
| උෂ්ණත්වය Temperature (Centigrade) | 23 32 C | 24 33 C | 23 31 C | 24 30 C | 23 30 C | 24 29 C | 23 28 C | 23 30 C | 24 29 C | 23 30 C | 24 30 C | 24 30 C |

වසමේ සම්පත් සිතියම - Resource Map

